# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**ජේ.බී. ගුරුසිංහ**
තොරතුරු හා විදුලි සංදේශ සියළු සේවක සංගමය
තැ . පෙ. 2293,
කොළඹ

**අභියාචක**

**අභියාචනා අංකය : 1429/2019**

එදිරිව

**ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.**
කොළඹ 01

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී ය. :**

1. විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම - කොමසාරිස්
3. ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. ජ්‍යෙෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :** පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

**ලිඛිත සැළකිරීම් :** **අභියාචක** - 2021.11.19
**පොදු අධිකාරිය** - ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය :** 2022.01.11

**තීරණය කළ දිනය :** 2022.01.11

## කොමිෂන් සභාවේ තීරණය

**අභියාචනයට පසුබිම් වූ කරුණු -**

2021.11.19 දිනැති ලිපිය මගින්, තම අභියාචනය ඉවත් කර ගැනීමට තීරණය කර ඇති බවට, අභියාචක කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

" … Whereas I have filed the above - mentioned application requesting information, And whereas now an administrative resolution have been arrived between the Respondent and the Applicant, and whereas I do not wish to proceed with this matter further, I hereby respectfully withdraw this application from the Right to Information."

"**…** වගඋත්තරකරු සහ අයදුම්කරු අතර පරිපාලනමය එකඟතාවකයට පැමිණ ඇති අතර**,** මෙම අභියාචනය තවදුරටත් පවත්වාගෙන යාමට අපේක්ෂා නොකරන බැවින්**,** මෙම අභියාචනය ඉල්ලා අස්කර ගන්නා බව.**"**

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි**,** රීති අංක 30(1) පහත පරිදි වේ.

*"අභියාචනයක් විභාග වෙමින් පවතින විට අභියාචකට ඕනෑම අවස්ථාවකදී කොමිෂන් සභාව වෙත ලිඛිතව හේතු දක්වා, ඔහු/ඇය විසින්ම අත්සන් කර, අනෙක් පාර්ශවය/න් වෙත ලබාදීම සඳහා පිටපතක් ද සමග ඉදිරිපත් කිරීම මගින් සිය අභියාචනය ඉවත් කර ගැනීමට හැකි අතර, කොමිෂන් සභාව අනතුරුව සියලු පාර්ශවයන්ට මෙකී අභියාචනය ඉවත් කර ගැනීම පිළිබඳ දැනුම්දීම ලබාදෙනු ඇත."*

රීති අංක 30(3) පහත පරිදි වේ.

*"ඉහත උප රීති (1) සහ (2) හි සඳහන් කරන හේතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තෘප්ත වේ නම්, අභියාචනය ඉවත් කර ගැනීමට ඉඩ දෙනු ඇත."*

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 30(3) ප්‍රකාරව, ලබාදී ඇති හේතුන් වලින් කොමිෂන් සභාව සෑහීමකට පත්වී ඇති බැවින් අභියාචනය ඉවත් කර ගැනීමට අවසර දෙනු ලැබේ.

මෙම නියෝගය අභියාචක වෙත**,** තොරතුරු නිළධාරි වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

****